කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


**නිවේදන අංකය : 01** **WW/TC/19/11/05/01**
වර්ණය : ඇම්බර්

# තද වැසි, තද සුළං සහ රළු මුහුදු ප්‍රදේශ පිලිබඳ පිලිබඳ විශේෂ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් **2019** නොවැම්බර් මස **05** වන දින ප.ව. **01.00** නිකුත් කරන ලදී.

## උතුරු අන්දමන් මුහුදු ප්‍රදේශය සහ යාබද ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආසන්නව පවතින අඩු පීඩන තත්ත්වය (බහුදින ධීවර යාත්‍රා සඳහා)

## සැලකිලිමත් වන්න!

උතුරු අන්දමන් මුහුදු ප්‍රදේශයේ සහ යාබද ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ **12.8N, 90.6E** ආසන්නව අඩු පීඩන තත්ත්වයක් වර්ධනය වී ඇත. එය ඉදිරි පැය **06** තුලදී පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී වයඹ දෙසට ගමන් කරනු ඇත. මෙම පද්ධතිය නැගෙනහිර-මධ්‍ය බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආසන්නව ඊළඟ පැය **48** තුලදී තවදුරටත් සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී වයඹ දෙසට ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

ඉහත සඳහන් කල මුහුදු ප්‍රදේශ වල නාවික සහ ධීවර කටයුතු වල නිරතවන්නන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

## මේ වනවිට තත්ත්වය:

පහත (රතු වර්ණයෙන් යුත්) **10.5$^0$N** සිට **14.5$^0$N** සහ **87. 0$^0$E** සිට **92.0$^0$E** අනතුරු ඇඟවීම් මුහුදු ප්‍රදේශයේ පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය හේතුවෙන්, එම මුහුදු ප්‍රදේශයේ තද වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. **70-80** පමණ) ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.




මීළඟ නිවේදනය **2019.11.06** දින ප.ව **01.00** ට නිකුත් කෙරේ.